

# වම් ඉවුරේ මිනිස්සු

රාජාංගනේ මතක සටහන්

## තොපට මොකට වන්නියෙ අඟනන්නෙ ගුණේ..?

කැඳ පොල් කටුවක රස බලමින් කොහොඹ ගහ යටට වී ඉතුරුම් මංගල්ලය දා සිදුවුණ දේ ආවර්ජනය කරමින් සිටි මා වෙත දුවගෙන ආ කොමලි කෙලී "අයියණ්ඩි ... අයියණ්ඩි.. විගැහින් යම.."යි කෑගාන්ට වුණා.

"මොකෑ අඩී හති දාගෙන..?"

"මලිත්ති අක්කා දිය බුං ගහනා තැන හුටු හුටුවෙන් ආව සංගෙ නැති ගොබ්ලො දෙන්නෙක් ඒකිට කොකම් පානවා... "

"මොකක් කිව්වා බොල ..? මම ට්‍රැක්ටරය පණ ගන්වාගෙන "නැගු නගා ... නැගු .. ඕකලා බොටුවෙන් අල්ලා ගන්ට.."

"යම අයියණ්ඩි .. යම.."

මා වෑ කණ්ඩියට කිට්ටු කරනකොටත් වෑ කන්ඩිය මත ගිණි බටේ දෙපැරන්දේ රුවාගෙන ඇන තියාගෙන සිටි මුත්තප්පා මාමා මා දුටු ගමන් කහට බැඳුණ දත් පෙන්නා සිනා සී "..මළයණ්ඩි බෝ බය ගන්ට කාරි නෑ... ඇච්චි හේන් ඉම එකෑවර ආගිරි ගානකොට මං මෙතන.. මගේ ඉහටිය දැක්ක සුනංගුවෙන් ඒකලා සුරුස් ගාලා ගියා.."

"මං ආවෙ ඕකලා වෑ ඉස්මත්තෙ ගස් බැඳලා හුටු හුටුවට ගිණි ලන්න.. අඩා මුත්තප්පා.. මොකෑ වුණේ..? කියාපිය සිලපේදිරි ඇතුව.."

"ඒක අහවරයි කොයින් රාලේ.. මං යනවා... මලයා තෝ කෙලීව ගෙට කරලාම පල .."

"මොකෑ කෙලී වුණේ..?"

"ආතේ ඒකලා මට බැද්දේ රිංගන්ට අඬගෑවා.. අහවල් එකටද මුත්තප්පා උන්ට යන්ට ඇරියෙ..?"

"මුත්තප්පා මතු වෙනකොටම ඒකලා රුං ගාලා ගියා... නැත්තං උං කම්බස්..."

"එහෙනං යමව් යමව්..."

මා මලී ගෙට කර ආවේ හිතේ ඇතිවුණ නොසන්සුන්තාව මග හරවා ගන්නට සැර බීම ටිකක් තොල ගෑමේ අදහසින්.

ලිපට එබිකම් කරනු දුටු මැණිකා "ඕං වල් ඌරු මස් තනාපුවා ලිප උඩ.. ආං වේලපු ගෝණ මස් මැස්සෙ.. මං යනවා මලිත්ති හදි ගැහෙන්ට..."

සැර බීම ටිකක් බී මස් කෑල්ලක රස බලමින් කොයින් මාමා දෙස බැලුවා.. හිස් කළ පොල් කටුව පසෙක තබා උන්දෑ මේ පද පේලිය දිගේලි කළා..

"කන්නේ හෝ තලා පොතු වැල් ගෙනේ
බොන්නේ බොර දියයි මඩ කඩිති ඉහිමිනේ
ඉන්නේ ළමැද උන් බඩ ගෙඩි නෙරාගෙනේ
දන්නේ නැතිද වන්නියෙ අඟනන්නෙ ගුණේ..?"

"උඹ කොහෙන් මාමා මේවා ඉගෙන ගත්තෙ ..?"

"මේ අහ.. වන්නියේ ගෑනුන්ට පිටින් එන ගොබ්ලෝ බැලුම් දාලා බැරි වෙනං කොට මිදි ගිලගන්ට බැරි වුණ හිවල් මොටා තරහ ඉලිප්පුවා වගේ හතර කෝරළේ නිලමක්කාරයෙක් මේ ඉම නෑම්බියෙකුට කොකම් පාලා බැරි වුණ තැන ඔහොම කීවා.. අපේ නෑම්බිත් මෙහෙමයි නිලමෙට උත්තර කිව්වෙ.

දනට අත දිදී කඳු හෙල් නගින්නනේ
අතින් පයින් කූඩැල්ලන් කඩන්නනේ
හතර කොරළේ පට මලු හිඟන්නනේ
තොපට මොකට වන්නියෙ අඟනන්නෙ ගුණේ..?"

"ඕකලාගෙ ගිරහයා හොඳා බේරුණේ.. නැත්නම් මුත්තප්පා ඉත්තේරුවෙන්ම ගිනි බිඳිනවා.. හේන් ඉමට හිත ඇති එකා.."

"මං යනවා පන්දම් මාරුවට.. බෝත් එනවා නම් වර.."

"ඉඳීන් මාමා මාත් එනවා...."

බෝගල

YSL
Migration Services

We specialise in

General Skilled Migration Visas
Applications for State Migration Plans
Onshore|Offshore Partner Visas
Sponsored Visitor|Tourist Visas
Student Visas
Parent Visas

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956

0430 359 006

(Close to Latrobe university , RMIT and NMIT)
6 Mat Rush Avenue, Bundoora, VIC 3083
Tel: 03 9467 4468
yasho@yslmigration.com

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0746956

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA